# 13. හොඳ ළමයා නුවණිනී

## හොඳ දේ තෝරා ගනී

**ශ්‍රේණිය** : **9**

**වාරය** : **II**

**නිපුණතා මට්ටම්** : **10.3 අද්‍යතන සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන සුවිශේෂතා හඳුනා ගෙන බස හසුරුවයි.**

**5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.**

<u>**ක්‍රියාකාරකම්**</u>

**01. පාඩම හොඳින් කියවා පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1. ළමා සාහිත්‍ය නිර්මාණ ලෙස හැඳින්වෙන්නේ මොනවා ද?

   ..........................................................................................................................................

2. එහි අනුප්‍රභේද දක්වන්න.

   ..........................................................................................................................................

3. ළමා සාහිත්‍ය පරිශීලනයෙන් අපේක්ෂිත කරුණු දෙකක් ලියන්න.

   (i) ..........................................................................................................................

   (ii) ..........................................................................................................................

4. ළමා කාව්‍ය අදාළ වන්නේ කිනම් වයස් කාණ්ඩයක දරුවන්ට ද?

   ..........................................................................................................................................

5. ළමා සාහිත්‍යයේ වස්තු විෂය පුළුල් ක්ෂේත්‍රයක පැතිර පවතී. ඒ මොනවා ද?

   ..........................................................................................................................................

.

6. ළමා කාව්‍යයක අන්තර්ගත ලක්ෂණ කීපයක් කුමාරතුංගයන්ගේ පද්‍යයේ දැක්වේ. ඉන් හතරක් ඔබේ වචනයෙන් ලියන්න.

   (i) ..................................................... (ii) .....................................................

   (iii) ..................................................... (iv) .....................................................

7. මුඛ පරම්පරාගතව පැවත ආ ජන කවි සාහිත්‍යයේ එන ළමා කවි තුනක මුල් පේළි ලියන්න.

   (i) ..........................................................................................................................

   (ii) ..........................................................................................................................

   (iii) ..........................................................................................................................

8. සේනක පඬිවරයාගේ චරිතය ඇතුළත් වන්නේ කිනම් කෘතියක ද?

   ..........................................................................................................................................

9. එහි රචකයා නම් කරන්න.

.......................................................................................................................................................

10. ජනශ්‍රැතියට අනුව ‘මා වැනි බිලින් දා’ කවියෙන් කියැවෙන්නේ කිනම් රජු පිළිබඳව ද?

.......................................................................................................................................................

**02. පාඩම ඇසුරෙන් පිළිතුරු ලියන්න.**

1. ළමයින් සඳහා ලියැවුණු ප්‍රථම සිංහල මුද්‍රිත කෘතිය

...............................................................................

2. ළමයින්ගේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා වූ පොත් දෙකකි. ............................ හා

...............................

3. ළමා පරිවර්තන කෘති දෙකකි.

(i) ....................................................... (ii) ..........................................................

4. නූතන ළමා සාහිත්‍යයේ පුරෝගාමියා වූ වී.ඩී ද ලැනරෝල් ලියූ ළමා සාහිත්‍ය කෘති හතරකි.

(i) ....................................................... (ii) .......................................................

(iii) ....................................................... (iv) .......................................................

5. සිංහල ළමා සාහිත්‍යයේ ආරම්භක අවධියේ සිටි නිර්මාණකරුවන් නම් කරන්න.

(i) ....................................................... (ii) .......................................................

(iii) ....................................................... (iv) .......................................................

(v) ....................................................... (vi) .......................................................

6. ආනන්ද රාජකරුණා මහතාගේ ළමා කාව්‍ය කෘති හතරක් නම් කරන්න.

(i) ....................................................... (ii) .......................................................

(iii) ....................................................... (iv) .......................................................

7. එස්. මහින්ද හිමියන්ගේ ළමා පද්‍ය සංග්‍රහ හතරක නම් ලියන්න.

(i) ....................................................... (ii) .......................................................

(iii) ....................................................... (iv) .......................................................

8. මුනිදාස කුමාරතුංග මහතා රචිත ප්‍රකට ළමා ගද්‍ය සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න.

(i) ....................................................... (ii) .......................................................

9. සිබිල් වෙත්තසිංහගේ කෘති කිනම් රටවල භාෂාවලට පරිවර්තනය වී තිබේ ද? රටවල් පහක් ලියන්න.

.......................................................................................................................................................

10. මෑත යුගයේ ළමා කවි නිර්මාණකරුවන් හතර දෙනෙක් නම් කරන්න.

(i) .................................................... (ii) ....................................................

(iii) .................................................... (iv) ....................................................

**03. පාඩමේ එන පහත වචනවල අර්ථය දී ඇති වචන අතුරෙන් තෝරා ලියන්න.**

1. සම්පාදනය - ................................................ * එරෙන මඩ සහිත තැන්
2. වාක්කෝෂය - ................................................ * පරාජය නොවන
3. පබැඳුම - ................................................ * සිදුවීමට ඉඩක් නැත / පුදුමාකාර
4. ප්‍රකට - ................................................ * දිව්‍ය ගාන්ධර්වයා
5. ව්‍යංග්‍යාර්ථය - ................................................ * සැකසීම / පිළියෙල කිරීම
6. සියොලඟ - ................................................ * ප්‍රසිද්ධ
7. සුගම - ................................................ * නිර්මාණය කළ කතාන්දරය
8. අද්භූත - ................................................ * වචන සමූහය
9. පෙරාතුව - ................................................ * සිරුර පුරා
10. අනභිභවනීය - ................................................ * කෙළින් නොකියා ඇඟවෙන්නට පැවසීම
11. ගොහොරු - ................................................ * පහසුවෙන් අවබෝධ වන
12. පන්සිළු - ................................................ * පළමුව / පෙර

**04. පාඩමේ දැක්වෙන පහත කෘතිවල කතුවරුන් සොයා ලියන්න.**

1. සින්දු කියන උණ පඳුර - ............................................................................
2. සරු පොළොවක් අපට ඇතේ - ............................................................................
3. කාව්‍යශේඛරය - ............................................................................
4. දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල - ............................................................................

**05. කැමති මාතෘකාවක් තෝරාගෙන ළමා කවි කීපයක් නිර්මාණය කිරීමට උත්සාහ කරන්න. එහි දී කවි පදයකට හිමි අකුරු / මාත්‍රා ගණන, එළිසමය වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.**

## <u>තනි පද</u>

විවිධ අර්ථ ඇති යෙදුමක් හෝ වාක්‍යාංශයක් සඳහා යෙදිය හැකි, ඒ අර්ථ සියල්ලම කැටි කොට ගත් පද තනි පද නම් වේ.

**01. පහත දැක්වෙන කොටස් සඳහා අදාළ තනි පදය ලියන්න.**

1. පා සතරක් ඇති - ................................................
2. ජලයෙන් උපන් - ................................................
3. තමා ගැන ම සිතා කටයුතු කිරීම - ................................................
4. කළගුණ නො සලකන - ................................................
5. ගමෙහි වාසය කරන්නා - ................................................
6. ජනයාගෙන් හිස් වූ - ................................................
7. දැවයෙන් ම සාදන ලද - ................................................

8. පිටතින් පැමිණි තැනැත්තා - ..................................................

9. විනාශ වී ගොස් ඉතිරි වූ කොටස් - ..................................................

10. බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තා - ..................................................

**02. මෙම තනි පද සඳහා අදාළ යෙදුම් හෝ වාක්‍යාංශ ලියන්න.**

1. දූරදර්ශී - ..................................................
2. උභයජීවී - ..................................................
3. කුතුහලය - ..................................................
4. ශෛලමය - ..................................................
5. නිශාචර - ..................................................
6. අසරණ - ..................................................
7. අපනයනය - ..................................................
8. මූර්ධජ - ..................................................
9. අම්ල - ..................................................
10. ප්‍රතිසංස්කරණය - ..................................................

## බහු අර්ථ පද

එක් පදයකින් බොහෝ අර්ථ නිරූපණය වීම යි. අර්ථය අවබෝධ කර ගැනීමට එය යෙදී ඇති වාක්‍ය පරිසරය දැන සිටීම අවශ්‍ය වේ.

**01. පහත වාක්‍යවල යටින් ඉරි ඇඳි බහු අර්ථ පදවල අර්ථය ඉදිරියේ ඇති හිස්තැන මත ලියන්න.**

1. අම්මා ඇයට **<u>කර</u>**මාලයක් තෑගි දුන්නා ය. - ..................................................

   වැඩපල **<u>කර</u>** ඈ වෙහෙසට පත්වෙයි. - ..................................................

2. පසළොස්වක **<u>සඳ</u>** පායනු වැන්නේ - ..................................................

   එ **<u>සඳ</u>** අප මහ බෝසතාණෝ දාන පාරමිතා පිරූහ. - ..................................................

3. රන් **<u>දද</u>** පළින් වූ හෙළි - ..................................................

   ඇවිදින් **<u>දද</u>** මහ ලූ - ..................................................

4. ඒ ඇසෙන්නේ ජය **<u>සක්</u>** නාදය යි. - ..................................................

   පඬුපුල් අසුන දරන්නේ **<u>සක්</u>** දෙවිඳු ය. - ..................................................

5. අනු **<u>නා</u>** හිමි විහාරයට වැඩම කළහ. - ..................................................

   වනාන්තරය **<u>නා</u>** පොළොං විමානයකි. - ..................................................

**02. මුලින් දැක්වෙන පදයේ බහු අර්ථයක් නොවන පදය තෝරන්න. යටින් ඉරක් අඳින්න.**

1. තුරු - ගස්, තෙක්, තරු, අහස
2. දන - ජනයා, දැවීම, ධනය, ධාන්‍ය
3. වත - සිරුර, මුහුණ, වස්ත්‍රය, පිළිවෙත
4. ලිය - කාන්තාව, වැල, ලියන්න, වෙල
5. තිර - පහන් වැටිය, ස්ථිර, මහත, කඩතුරාව

<u>පිළිතුරු</u>

## හොඳ ළමයා නුවණිනී

## හොඳ දේ තෝරා ගනී

**01.** 1. දරුවන් උදෙසා කෙරෙන නිර්මාණ.

2. ළමා කතා, ළමා කාව්‍ය, ළමා ගීත සංග්‍රහ, ළමා කවි කතා, ළමා නාට්‍ය

3. (i) භාෂා ඥානය වර්ධනය (ii) වාක්කෝෂය පුළුල් වීම

4. අකුරු හුරු වන අවධියේ සිට අවුරුදු දොළහ පමණ දක්වා දරුවන්ට

5. ගහ කොළ, සතුන් ආදී අවට පරිසරය, ස්වාභාවික වස්තු, එදිනෙදා ජීවන අත්දැකීම්, සුරංගනාවන්, රාක්ෂසයන්

6. (i) පහසුවෙන් වැටහී යාම (ii) සිත් පුබුදු කරවීම / වැඩිහිටියන් පැහැදීම
(iii) ඉබේම ක්‍රියාකාරී වීම (iv) දරුවන්ගේ ඇගයීමට බඳුන් වීම

7. (i) ටිකිරි ටිකිරි ටිකිරි ලියා
(ii) අතුරු මිතුරු දඹදිව තුරු
(iii) කොප්පර කොප්පර පිපිඤ්ඤා

8. කාව්‍යශේඛරය

9. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

10. හයවැනි පරාක්‍රමබාහු රජු

**02.** 1. හෝඩි පොත

2. බාලාවබෝධනය, නන්දන හෝඩි පොත

3. (i) අලි බබා හා හොරු හතළිහ (ii) අභිනව අරාබි නිසොල්ලාසය

4. (i) අන්දරේ හෙවත් රජවාසල කවටයා (ii) මහදැන මුත්තා හා ගෝල පිරිස
(iii) ඇලඩින්ගේ පුදුම පහන (iv) පද්මාවතී

5. වී. ඩී. ද ලැනරෝල්, තියඩෝර් ජී. පෙරේරා, ආනන්ද රාජකරුණා, මාරි මියුසියස්, කුමාරතුංග මුනිදාස, හියුබන් දිසානායක, මාර්ටින් වික්‍රමසිංහ ..ආදි

6. ළදරු ගී, ළමා උයන, ළදරු කවි, ළදරු කවි මග, ළදරු කවි මී.

7. කවිමිණ, කවිමුතු, ළමා කවි කලඹ, ඔවාමුතුදම

8. මඟුල් කෑම, හත්පණ, හීන් සැරය

9. චීනය, ජපානය, කොරියාව, පිලිපීනය, නෝර්වේ, ඇමරිකාව .. ආදි

10. කේ. ජයතිලක, ගුණසේන විතාන, මහගම සේකර, ඩබ්ලිව්.ඒ. අබේසිංහ

**03.** 1. සැකසීම / පිළියෙල කිරීම
2. වචන සමූහය
3. නිර්මාණය කළ කතාන්දරය
4. ප්‍රසිද්ධ
5. කෙළින් නොකියා ඇඟවෙන්නට පැවසීම
6. සිරුර පුරා
7. පහසුවෙන් අවබෝධ වන
8. සිදුවීමට ඉඩක් නැත / පුදුමාකාර
9. පළමුව / පෙර
10. පරාජය නොවන
11. එරෙන මඩ සහිත තැන්
12. දිව්‍ය ගාන්ධර්වයා

**04.** 1. රත්න ශ්‍රී විජේසිංහ
2. මහගම සේකර
3. ශ්‍රී රාහුල හිමි
4. එස්. මහින්ද හිමි

## තනි පද

**01.** 1. සිවුපා
2. ජලජ
3. ආත්මාර්ථකාමී
4. අකෘතඥ
5. ගැමියා
6. ජනශූන්‍ය
7. දැවමුවා
8. ආගන්තුකයා
9. නටබුන්
10. බහුශ්‍රැත

**02.** 1. දුර දිග බලා කටයුතු කරන
2. දිය ගොඩ දෙකෙහි ම වසන
3. යම් දෙයක් ගැන සොයා බැලීමේ ආසාව
4. ගලින් ම කරන ලද
5. රාත්‍රී කාලයේ හැසිරෙන
6. කිසිවෙකුගේ පිහිටක් නැති
7. රටින් පිටරටට යැවීම
8. මුදුනින් උපදින්නා වූ
9. මිල කළ නොහැකි
10. නැවත යථා තත්ත්වයට පත් කිරීම

## බහු අර්ථ පද

**01.** 1. ගෙල, කිරීම
2. චන්ද්‍රයා, කාලයේ
3. කොඩි, බමුණු
4. හක් ගෙඩි, ශක්‍ර
5. නායක, නාග

**02.** 1. අහස
2. ධනය
3. සිරුර
4. වෙල
5. මහත